පළාත් භාණ්ඩාගාර චක්‍රලේඛ අංක :- 2010/07

NCP/CS/PT/AP/FM/05
පළාත් භාණ්ඩාගාරය,
උතුරු මැද පළාත,
අනුරාධපුර.
2010.02.23

ව්‍යවස්ථාපිත මණ්ඩල වල සභාපතිවරුන් සහ
ආයතන ප්‍රධානීන් වෙත.

## පළාත් සභාවේ ව්‍යවස්ථාපිත මණ්ඩල වල වාර්ෂික ගිණුම් ඉදිරිපත් කිරීම -2009

එක් එක් මුදල් වර්ෂය අවසානයේදී අදාළ ප්‍රඥප්ති වල සඳහන් විධිවිධාන අනුව අවසාන ගිණුම් සකස් කර විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම සියළුම ව්‍යවස්ථාපිත ආයතන වල සභාපතිවරුන්ගේ වගකීමක් වේ.

02. ඒ අනුව 2009 වර්ෂය වෙනුවෙන් වන අවසාන ගිණුම් 2010 මාර්තු 31 වන දිනට පෙර පහත දී ඇති උපදෙස් වලට අනුකූලව සකස් කර අධ්‍යක්ෂක මණ්ඩල අනුමැතියකින් පසු විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය.

2.1 වාර්ෂික ගිණුම් උපචිත පදනම මත සකස් කළ යුතු අතර ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම් ප්‍රමිතයන්ට අනුකූල විය යුතුය. රාජ්‍ය ගිණුම් ප්‍රමිතයන් ඇතුළත් ගොනුවක් විද්‍යුත් මාධ්‍යයෙන් පළාත් භාණ්ඩාගාරයෙන් ලබා ගත හැකි අතර නැතහොත් www.ncp.gov.lk වෙබ් අඩවියට පිවිසීමෙන් ලබාගත හැකිය.

2.2. වාර්ෂික ගිණුම් පහත සඳහන් ගිණුම් හා වාර්තා වලින් සමන්විත විය යුතුය.

(අ). ආදායම් සහ වියදම් ගිණුම/ ක්‍රියාකාර ගිණුම
(ආ). ශේෂ පත්‍රය
(ඇ). අරමුදල් ප්‍රවාහ ප්‍රකාශය සහ
(ඈ). පෙරවදනක් සහිත කාර්ය සාධන වාර්තාව.

2.3. ගිණුම් පිළියෙල කිරීමේදී සිංහල, ඉංග්‍රීසි සහ දෙමළ යන භාෂාත්‍රයෙන් වෙන වෙනම පිළියෙල කර ඉදිරිපත් කළ යුතුය.

2.4. ගිණුම් ඉදිරිපත් කිරීමේදී දෝෂ වලින් තොර විය යුතු අතර මීට පෙර එවා ඇති විගණන විමසුම් වලට හා විගණකාධිපති වාර්තා වලට අවධානය යොමු කොට එමගින් නිරීක්ෂිත අඩුපාඩු වළක්වා ගැනීමට කටයුතු කළ යුතුය.

2.5. ගිණුම් ඉදිරිපත් කිරීමේදී පිටපත් 04 ක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු අතර ගිණුම් සහතික කිරීමෙන් පසු විගණකාධිපතිවරයා විසින් පහත සඳහන් පරිදි එම ගිණුම් බෙදාහරිනු ලැබේ.

| | | |
|---|---|---|
| 1. මුල් පිටපත | - | පළාත් භාණ්ඩාගාරයේ ගිණුම් හා ගෙවීම් දෙපාර්තමේන්තුවට |
| 2. දෙවන පිටපත | - | අදාළ අමාත්‍යාංශයට |
| 3. තෙවන පිටපත | - | ගිණුම් ඉදිරිපත් කළ ආයතනයට |
| 4. හතරවන පිටපත | - | විගණකාධිපති විසින් රඳවා ගනු ලැබේ. |

03. ඒ අනුව ඉහත උපදෙස් පරිදි සකස් කරන ලද ගිණුම් 2010.03.31 දිනට පෙර විගණකාධිපති වෙත ඉදිරිපත් කරන ලෙස කාරුණිකව දන්වන අතර සියළුම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් සහ ගණන් දීමේ නිලධාරීන් විසින් මෙම කාර්ය නිසිපරිදි ඉටුකරනු ඇතැයි අපේක්ෂා කරමි.

**ඒ.තලාකොටුනගේ,**
ප්‍රධාන ලේකම්,
උතුරු මැද පළාත.

| | | | |
|---|---|---|---|
| පිටපත්:- | 01. සියළුම අමාත්‍යාංශ ලේකම්වරු | - | දැ.පි |
| | 02. විගණකාධිපති | - | දැ.පි. |